# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2022 අංක 17 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 ජූනි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 ජූනි මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල : රු. 10.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2022 අංක 17 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ජූනි මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 58/2021

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක 17 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

101 වන අධිකාරයට 154අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**2.** (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 154 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම සංග්‍රහයේ 154අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"ඇතැම් අවස්ථාවල දී ඔප්පු හෝ ලේඛන ඔප්පු කිරීම අවශ්‍ය නොවන බව

154අ. (1) (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (60 වන අධිකාරය වූ) අන්තිම කැමති පත්‍ර ආඥාපනත යටතේ ලියා අත්සන් කරන ලද අන්තිම කැමති පත්‍රයක් හැර, බැලූ බැල්මටම නිසි පරිදි ලියා අත්සන් කරනු ලැබ ඇති බවට පෙනී යන සහ සහතික කිරීම සඳහා නීතිය මගින් නියම කරනු ලැබ ඇති යම් ඔප්පුවක් හෝ ලේඛනයක් -

(අ) මේ සංග්‍රහය ප්‍රකාරව සාමාන්‍ය කාර්ය පටිපාටිය යටතේ ගොනු කරන ලද නඩුවක උත්තරවාදවල හෝ වැඩිදුර උත්තරවාදවල එම ඔප්පුවේ හෝ ලේඛනයේ ලියා අත්සන් කිරීම හෝ නිර්ව්‍යාජභාවය අභියෝගයට ලක් කරනු ලැබ ඇත්නම් සහ විසඳිය යුතු ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස; හෝ

(ආ) අධිකරණයට එවැනි ඔප්පු කිරීමක් අවශ්‍ය වුවහොත් මිස,

මේ සංග්‍රහය යටතේ වූ යම් නීති කෘත්‍යයන්හි දී, එවැනි යම් ඔප්පුවක හෝ ලේඛනයක ලියා අත්සන්

කිරීම හෝ නිර්ව්‍යාජභාවය පිළිබඳ විධිමත් සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතු ය:

එසේ වුව ද, මේ සංග්‍රහය යටතේ වූ යම් නීති කෘත්‍යයක දී, යම් නඩුවක පාර්ශ්වයක් ස්වකීය උත්තරවාදවල ඇතුළත් කර නොමැති යම් ඔප්පුවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලා සිටින අවස්ථාවක දී මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

(2) මේ සංග්‍රහය යටතේ ලඝු නඩු කාර්ය පටිපාටිය මත වූ නීති කෘත්‍යයන්හි දී, (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.”.

අන්තර්කාලීන විධිවිධාන

**3.** මේ පනතේ 2 වන වගන්තියේ සහ සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී විභාග වෙමින් පවත්නා යම් නඩුවක හෝ අභියාචනයක -

(අ) (i) විරුද්ධ පාර්ශ්වය, සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලබන ඔප්පුව හෝ ලේඛනය සාක්ෂි ලෙස භාර ගැනීමට විරුද්ධ නොවන්නේ නම් හෝ විරුද්ධ වී නොමැති නම්; හෝ

(ii) විරුද්ධ පාර්ශ්වය, සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලබන ඔප්පුව හෝ ලේඛනය සාක්ෂි ලෙස භාර ගැනීමට විරුද්ධ වී ඇති මුත්, නඩුවක් අවසාන කරනු ලබන අවස්ථාවේ දී සාක්ෂි ලෙස එම ලේඛනය කියවනු ලබන විට විරුද්ධ වී නොමැති නම්,

තවදුරටත් වූ ඔප්පු කිරීමකින් තොරව, අධිකරණය විසින් එම ඔප්පුව හෝ ලේඛනය සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ය;

(ආ) විරුද්ධ පාර්ශ්වය, සාක්ෂි ලෙස ඔප්පුවක් හෝ ලේඛනයක් භාර ගැනීමට විරුද්ධ වන්නේ නම් හෝ විරුද්ධ වී ඇති නම්, එම ඔප්පුවේ හෝ ලේඛනයේ ලියා අත්සන් කිරීම හෝ නිර්ව්‍යාජභාවය සම්බන්ධයෙන් සිදුකර ඇති විරෝධතාවල හරය සැලකිල්ලට ගනිමින් අධිකරණය විසින්

එවැනි ඔප්පුවක් හෝ ලේඛනයක් පිළිබඳ විධිමත් ඔප්පු කිරීමක් අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය වන්නේ ද හෝ අවශ්‍ය වූයේ ද යන්න තීරණය කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.